# මළ ජූලි හතකින්වත් පාඩමක් නො ගන්නා ...






බලයට හා ආධිපත්‍යයට මහ ජාතීන් අතර පවත්නා තෘෂ්ණාව නැති කිරීම ලෝක සාමය ඇති කිරීමෙහි ප්‍රධාන මාර්ගයක් බව, බොහෝ කලක සිට පැවැත එන මතයකි. ඇමෙරිකාව එංගලන්තය හා රුසියාව ලෝක බලවතුන් වූ යුගයේ ප්‍රචලිත වූ එම කියමන, තනි රටක දේශපාලනය විග්‍රහ කිරීමේදී ද බැහැර කළ නො හැක්කකි.

ජාතිකත්වයක සුවිශේෂී අනන්‍යතාවන්ට ගරු කිරීමට නො පෙළඹෙන කල, ප්‍රාථමික අවධියේ, ජාතිකත්ව අතර ගැටුම් හටගත්තා යැයි විශ්වාස කළ හැක. එම තත්ත්වය වත්මන් සමාජ තලයේ ද දැක ගැනීමට හැකි වන්නේ නම් අවාසනාවකි. එවන් වරදක් සිදු වන්නේ නම් ඒ නූගතුන් වෙතිනි. තමන් නොවේ හෝ තම පරපුර යැයි විශ්වාස නො කරන හෝ කල් හි තවත් ජාතියක් තලා - පෙළා ඉන් සතුටක් විඳීම තිරිසන් ගතියක් මිස අන් කවරක් ද ? එ වැන්නෝ අද ද වෙසෙන බවට ඉඟියක් දැනෙන්නේ නම් එම සමාජය ශෝධනය කළ යුතු නවීනතම ක්‍රියා මාර්ග පිළිබඳව ද අවධානය යොමු කළ යුතු ය.

නිදහසින් පසු මෑත ලංකා ඉතිහාසයේ, දශක කිහිපයක, සිහි බුද්ධියෙන් කල් ගෙවූවෙකුට වත්මන් සමාජ අර්බුදයේ සන්ධිස්ථාන චිත්‍රපටයක් සේ පුනරාදර්ශනය වනු ඇත. එහෙත් මෑත උපන්නෙකුට එසේ නොවේ. ඔහුට හෝ ඇයට හෝ එය ග්‍රහණය කර ගැනීමට හැකි වන්නේ එම දශක කිහිපය තුළ වන සංසිද්ධීන්ගේ විග්‍රහයන් ඇසුරු කිරීමෙනි.

යටත් විජිත වාදයෙන් ලංකාව නිදහස් කර ගැනීමට ජාතිකත්ව භේද පසෙක ලා එක්ව නැඟී සිටීම, ව්‍යවස්ථාදායකයේ ප්‍රවණතා, වාමාංශික ව්‍යාපාරයේ පෙරළි, සුළු ජාතිකත්වයේ අයිතීන්, සිංහල රාජ්‍ය භාෂාව කිරීම, ජාතිකත්ව අතර ගැටුම්,

ගිවිසුම්, විධායකය හා සන්නද්ධ ගරිල්ලා ව්‍යාපාරය ආදී කරුණු එම ඝනයේ ලා සැලකිය හැක.

මේ සියලු සිද්ධි අබිබවා, ජාතිකත්ව අර්බුදය නව මානයකට ගෙන ඒමට හේතු වූයේ, 1983 ජූලි මාසයේ සිදු වූ මහා දමිළ සංහාරය යි. ලංකාවේ දකුණු ප්‍රදේශයේ, නගර රාශියක විසූ අහිංසක දමිළ පුරවැසියනට අත් කළ මහා ව්‍යසනය ඇසින් දුටුවෙකු ලෙස, අදටත් මා තුළ ඇත්තේ වචනයෙන් විස්තර කළ නො හැකි පිළිකුලකි.

සුජාත රාජ්‍යයක ලක්ෂණ, ලංකාවෙන් පහව ගිය බවට, අපමණක් සාක්ෂි සහිතව සනාත කරනු ලැබූ බේදවාචකයක් ලෙස, 83 සිදුවීම් හැඳින්විය හැකිවන්නේ එම පිළිකුල් සහගත භාවය ප්‍රකටවීම තුළිනි. දෙස්-විදෙස් බොහෝ සංවේදී සිත් සතන් ඉන් මිරිකී ගියේ ය.

ශ්‍රී ලංකා ජාතික රාජ්‍යය හෙවත් ඇතැම් විට හඳුන්වන ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීමට නම් ජාතිකත්ව අතර ප්‍රධාන අංග තුනක් ස්ථාවර විය යුතු ය. සමගිය, සහජීවනය හා විශ්වාසය එම අංග තුනයි. 1950 දශකය ආරම්භයේ සිටම ඒ තුන් ඈඳුතු දහම පළුදු වන ආකාරයේ උත්තේජන සැපයිණි. ඒ අනුව 1951 පමණ සිට ලංකාව සුජාත රාජ්‍යයක්වීම සඳහා අත්‍යවශ්‍ය, ජාතීන් අතර තිබිය යුතු සහජීවනය බිඳ වැටුණි.

ඒ පිළිබඳව එ කල සිට විවිධ කතිකා ගොඩනැඟුණි. එහෙත් නිදහසින් පසුව අඩ සියවසක් ගෙවී ගිය ද නිවැරැදි ප්‍රතිපත්තියක් සම්පාදනය කරගැනීමට, අපට නො හැකි වී ඇත. එ බැවින් අද ඉතිරිව සිටින්නේ ජාතිකත්ව අතර අවිශ්වාසය පැතිරුණු, විරසක වූ සහ විසිරී ගිය ජන සමූහයකි. එවන් පසුබිමක දී එම ජන සමූහයට වගකිවයුතු රාජ්‍ය තන්ත්‍රය නිතැතින්ම අර්බුදයට යයි. සමාජය තුළ වන විවිධ ප්‍රති විරෝධයන් කළමනාකරණය කර ගත නො හැකි තැනකට රාජ්‍යය සේන්දු වන්නේ එවිට ය.

යම් ප්‍රශ්නයක් පැන නැඟුණු කල් හි, එය සාමකාමීව විසඳා ගැනීම වෙනුවට හිංසනය මගින් එය ජය ගැනීමට බහුතරයක් පාර්ශව පෙළඹී සිටින්නේ ද මේ හේතුවෙනි. පුද්ගල සහ සමාජ කණ්ඩායම් කෙසේ වෙතත් රාජ්‍ය හස්තය ද ඒ තැනට යොමුව සිටීම මෙහි ඇති භයානකම තත්ත්වයයි.

සමාජය මේ තැනට තල්ලුවීම සම්බන්ධව රට තුළ වන ආගමික සංස්ථාව ද වගකිව යුතු ය. විශේෂයෙන් ලංකාවේ ජාතික ගැටලුව විසඳීම සඳහා යුද්ධයම අවශ්‍ය යැයි කියන ස්ථාවරය වැපිරීමට අපේ ආගමික සංස්ථාව අසීමිත ලෙස හොරණෑ වයා ඇත. ආගමික සංස්ථාව තුළ යම් පිරිසක් ඊට එරෙහි වුව ද ඒ හඬ යටපත් කිරීමට, යුදවාදී හඬ සමත්ව සිටී. විශේෂයෙන් අපගේ සමාජයේ, බෞද්ධ

සංස්ථාවේ ඇතැම් කොටස් රැගෙන යන යුදවාදය - එයට උදාහරණ සපයයි. මේ ව්‍යසනකාරී මතය මිනිසාගේ සාමාන්‍ය දිවියේ හැසිරීම් දක්වා ද දිවගොස් ඇත.

1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ 20 වන වගන්තියෙන් පැහැදිලිව දක්වා ඇති, ජාතිවාදී වෛරී ප්‍රකාශ තහනම් කළ යුතු යි යන්න පවා තඹයකට මායිම් නො කරන සමාජයක අපි අද දිවි ගෙවන්නෙමු. නමුත් ජර්මනියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද වන, ජාතීන් අතර වෛර ගොඩනැංවීමට එරෙහි වගන්ති, 1978 දී ලංකාවේ සම්මත කර ගත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ ද ඇතත්, ඒ පනත අද ක්‍රියාත්මක වන්නේ වෙනත් අර්ථයකින් වීම අදාළ ප්‍රස්තුතය ප්‍රශ්න නො කරයි.

1983 කළු ජූලිය නිර්මාණය වන්නේ ද මෙවන් පසු බිමක ය. ලාංකේය සමාජය ඉන් විශාල පාඩමක් ඉගෙනගත යුතුව තිබුණි. විශේෂයෙන් සිංහල සමාජය තවමත් එය ඉගෙනගත් බවක් පෙනෙන්නට නැත. ඒ නිසා කුමන තත්ත්වයක් මත වුව ගරිල්ලා ව්‍යාපාරයේ මූලෝපායන් පරාජය කිරීම වෙනුවට. එය ශක්තිමත් කිරීමට පදනම වැටී හමාර ය. නැතහොත් දේශපාලන ත්‍රස්තවාදය ( Political Terrorism ) ස්ථාවර කරගැනීම උදෙසා සෑම පාර්ශවයක්ම ගන්නා ක්‍රියාමාර්ග ශක්තිමත් වී ඇත. තම අරමුණ ස්ථාවර කරගැනීම උදෙසා වන මූලෝපායන් සාධනීය තලයකට ගෙන ඒමට දේශපාලන ත්‍රස්තවාදය රුකුල් කරගත් බවක් හැඟී යයි.

දේශපාලන අරගලයක ස්වභාවයේ තිබූ උතුරේ ගැටලුව, 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මිලිටරි අරගලයක් බවට පත් කළේ ය. දෙමළ ජනයා තම ග්‍රහණයට ගැනීමට විමුක්ති කොටිනට පහසු මඟක් ඒ හරහා විවර විය. දෙ වනුව ප්‍රධාන පාර්ශව දෙක අතර වන දේශපාලන ත්‍රස්තවාදය උච්ඡ වූ කළ අදාළ ප්‍රදේශයන් හි රාජ්‍ය බලය හීන විය. තෙ වනුව එම ත්‍රස්තවාදයට - ත්‍රස්තවාදයෙන් ම පිළිතුරු දීමට යාම තුළ රජය හා අනෙකුත් ආයතනික අංශ අකර්මන්‍යවීම හා සිව් වනුව දේශපාලන විසඳුමක් පිළිබඳව වන සමාජයේ උනන්දුව පහළ වැටීම සිදු විය.

83 කළු ජූලිය නිර්මාණය වූයේ කළේ මේ ප්‍රවණතා මධ්‍යයේ ය. රට ආර්ථික මඩ ගොහොරුවක ගිල්වා දැමීමට ද එය සමත් විය. විශේෂයෙන් ඒකීය රාජ්‍ය සංකල්පය බිඳ දමා ශ්‍රී ලංකාව විමධ්‍යගත රාජ්‍යයක් බවට පත් කිරීමට ව්‍යවස්ථාමය පසුබිම සැකසීම ද එහි ප්‍රතිඵලයකි.

1983 කළු ජූලියේ ආවර්ජනයන්ට මාධ්‍යයන් හි දැන් දැන් ( මෙවර ද ) එ තරම් ඉඩක් වෙන් නොවී තිබීම ද විශේෂත්වයකි. රටේ පවතින කැළඹිලි සහගත සහ අවිනිශ්චිත වාතාවරණය ඊට බලපෑවාදැයි නිශ්චිතවම නිගමනය කළ නො හැකි වුවත්, තොප්පිගල උණුසුම එයට හේතුවක් වූ බව කිව හැක. අතීතයෙන් පාඩම් උගෙනීමට රිසි සහ අතීතයේ සුවිශේෂයන් සැමරුමට රිසි අයට එසේ හුදෙකලා විය

නො හැකි ය. කෙසේ වෙතත්, 83 ජූලියේ මතක, ඉතා පහසුවෙන් තොප්පියකින් වසා දැමීමට තැත් කරන්නේ නම් එය ද අනුවණ කමකි.

**ජනිත් විපුලගුණ**

*2007 ජූලි 27*